----------------------------------------------------------------------------------------------------------------------

පච්චිලයිපල්ලි ප්‍රාදේශිය සභාව

කිලිනොච්චි දිස්ත්‍රික්කය.

------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 15 දින ඉදිරිපත් කරන ලදි. වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 03 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

--------

මාගේ පරික්ෂනයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරිම් අනුව පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවටත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පච්චිලයිපල්ලි ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරන ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

--------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් ගිණුම් වල නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | 03 | 312,450 | 01 | 255,272 |
| වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 13,440 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු. 13,115,877 ක් වූ ගනුදෙනු 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 338,519 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 24,051 ක් විය.

2.2 මූල්‍ය පාලනය

අයවැය ලේඛනය නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම නිසා ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම් සහ වියදම් වල පිළිවෙලින් රු. 1,821,940 ක් හා රු. 1,713,306 විචලනයන් ඇති වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත<br>රු. 000 | තථ්‍ය<br>රු. 000 | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම<br>රු. 000 |
|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 15 | - | - |
| (ii) | බදු කුලී | 3,400 | 3,703 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 98 | 218 | - |
| (iv) | වෙනත් ආදායම් | 16,082 | 14,036 | 956 |

### 2.3.2 ආදායම් අහිමි වීම

සභාවට අයත් ප්‍රදේශයේ දේපල සඳහා වරිපනම් බදු ගණනය කර අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් සභාවට ආදායම් අහිමි වි තිබුණි.

### 2.3.3 මුද්දර ගාස්තු

(අ) 2012 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා කලපරිච්ඡේදයට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙතින් ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම වු රු. 309,550 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010-2011 කාලපරිච්ඡේදයට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙතින් ලැබිය යුතු වටිනාකම රු. 425,400 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

2.4.1 ලැබිය යුතු ගිණුම්

පුර නැගුම මූලධන ප්‍රදාන ප්‍රතිපූරණය කිරිම සඳහා සභාවේ අරමුදලින් ගෙවන ලද රු. 255,272 අත්තිකාරම් නිරවුල් කර නොතිබුනි.

2.4.2 වාහන උපයෝජනය

(අ) සභාවේ සී සෑමේ යන්ත්‍ර 8 ක් සඳහා බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගන නොතිබුනි.

(ආ) සී සෑමේ යන්ත්‍ර 5 ක් භාවිතා කර නොතිබුනි.

2.5 අනුකූල නොවීම්

පහත සඳහන් නීති,රිති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදි නිරික්ෂණය විය.

| | නීතිරිති රෙගුලාසි කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවිම් |
|---|---|---|
| (i) | 1989 ප්‍රාදේශිය සභා ( <u>මූල්‍ය හා පරිපාලන) රිති</u> | |
| | ii පරිච්ඡේදයේ 5 වගන්තිය උපවගන්තිය xii | මුදල් හා ගබඩා යනාදිය සම්බන්ධයෙන් ක්‍රියාකරන නිලධාරින් ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුනි. |
| | iii පරිච්ඡේදයේ 81 වගන්තිය | එක් එක් කාර්තුව අවසානයේදි ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිබඳ සභාව විසින් කටයුතු කර නොතිබුනි. |
| (ii) | 1990 ඔක්තෝබර් 10 දිනැති | සභාව සතු වාහන වල ඉන්ධන දහනය පිළිබඳ |

අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය    පරීක්ෂා කර නොතිබුනි.

2.6 ආදායම් එකතු නොකිරීම

2.6.1 විදුලි සංදේශ කුළුණු ගාස්තු

2009.04.17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය පරිදි සභාබල ප්‍රදේශයේ සවිකර ඇති විදුලි සංදේශ කුළුණු වෙනුවෙන් ගාස්තු අයකර නොමැත.

2.6.2 ප්‍රචාරණ දැන්වීම් ගාස්තු අය නොකිරීම

වසන්තම් එෆ්එම් නාලිකාවේ ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුනි.

2.7 වත්කම් කළමනාකරණය

2.7.1 නිශ්ක්‍රීය භෞතික සම්පත්

බැංකු ගිණුමක රු.17,853ක ශේෂයක් වසර 04 කට වැඩි කාලයක් නිෂ්ක්‍රීයව පැවති බව විගණනයේ දී අනාවරණය විය.

2.7.2 සභාව සතු වාහනයක් අවභාවිතා කිරීමෙන් සභාවට ඇති වූ රු. 109,573 ක පාඩුව.

පුද්ගලික ගමන් වෙනුවෙන් වවුනියාව ප්‍රදේශයට යෑම සඳහා සභාව සතු පික්අප් වාහනයක් සභාපතිවරයා විසින් භාවිත කර තිබුනි. 2012 ජනවාරි 09 සිට මැයි 25 දක්වා කි.මී. 7,279 ක් මේ ආකාරයට ධාවනයේ යෙදීම සඳහා ඩීසල් ලීටර් 921 ක් වෙනුවෙන් රු. 109,572 ගෙවා තිබුනි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රියදුරකු නොමැතිව තමන් විසින්ම කි.මී. 2112 ක දුරක් සභාපතිවරයා විසින් ධාවනය කර තිබූ අතර ඒ පිළිබඳ දෛනික ධාවන සටහන් පවත්වා නොතිබුනි.

(ආ) මේ ලෙස වාහනය අවභාවිත කිරීම හේතුවෙන් සභාවේ එදිනෙදා රාජකාරි කටයුතු අඩපන වී තිබුනි.

2.8 ලැබිය යුතු ගිණුම

රු.63,514 ක්වූ ආදායම් ණයගැතියෝ නියමිත කාලයේදී අයකරගෙන නොතිබුනි.

2.9 කොන්ත්‍රාත් පරිපාලනය

2.9.1 ක්‍රියාත්මක නොවූ සැලසුම්

මව සහ දරුවා වැඩසටහන සඳහා පරිත්‍යාග වශයෙන් ලැබූ රු. 42,110 ක් ඒ වෙනුවෙන් භාවිතා කර නොතිබුනි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් එකතු කිරිම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) පරිත්‍යාග
(ඉ) විවිධ තැන්පත්
(ඊ) අයවැය ලේඛණය